දුරකථන / தொலைபேசி / Telephones } 011-2136600 / 011-2136650
ලේකම් / செயலாளர் / Secretary } 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2876169 / 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail } info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla.**

මගේ අංකය / எனது இல. / My No. } PSC/EST/05-03/05/2015

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2020.06. 18

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ: 05 /2020

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>විධායක හා ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණයන් යටතේ අනුමත බඳවා ගැනීමේ පටිපාටි හෝ / හා සේවා ව්‍යවස්ථා අනුව විශේෂ ශ්‍රේණියට සහ පළමු ශ්‍රේණියට උසස් කිරීම සඳහා පශ්චාත් උපාධි සුදුසුකම අදාළ කර ගැනීම</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව විධායක සහ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණයන් සඳහා අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථා අනුව පශ්චාත් උපාධි සුදුසුකමක් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය සලකා බැලීමෙන් පසු විධායක සේවා ගණයේ I ශ්‍රේණියට උසස් කර ඇති නිලධාරියෙකු විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේදී පහත පරිදි කටයුතු කරනු ලබන්නේය.

I. I ශ්‍රේණියට සහ විශේෂ ශ්‍රේණියට උසස්වීම සඳහා ක්ෂේත්‍ර දෙකක පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයන් දක්වා ඇති විටකදී

| | |
|---|---|
| නිලධාරියා I ශ්‍රේණියට උසස්වීමට සම්පූර්ණ කල පශ්චාත් උපාධියේ ක්ෂේත්‍රය විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කල යුතු <u>ක්ෂේත්‍රයම නම්</u> | එම නිලධාරියා විසින් විශේෂ ශ්‍රේණියට උසස්වීම සඳහා එම ක්ෂේත්‍රයේ තවත් පශ්චාත් උපාධි සුදුසුකමක් ලබා ගත යුතු නොවේ. I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අදාළ කර ගනු ලැබූ සුදුසුකම විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහාද <u>අදාළ කරගත හැක්කේය.</u> |
| නිලධාරියා I ශ්‍රේණියට උසස්වීමට සම්පූර්ණ කල පශ්චාත් උපාධියේ ක්ෂේත්‍රය විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කල යුතු <u>ක්ෂේත්‍රයට අදාළ නොවේනම්</u> | එම නිලධාරියා විසින් විශේෂ ශ්‍රේණියට උසස්වීම සඳහා සම්පූර්ණ කල යුතු ක්ෂේත්‍රයේ තවත් පශ්චාත් උපාධි සුදුසුකමක් ලබා ගත යුතුය. I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අදාළ කර ගනු ලැබූ සුදුසුකම විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහාද <u>අදාළ කරගත නොහැක්කේය.</u> |

II. නිලධාරියකු පශ්චාත් උපාධි සුදුසුකමක් මූලික සුදුසුකමක් වීම මත සේවයට බඳවා ගෙන ඇති අවස්ථාවකදී I ශ්‍රේණියට හා විශේෂ ශ්‍රේණියට උසස්වීම සඳහා, බඳවා ගනු ලැබූ අවස්ථාවේදී ඉදිරිපත් කරනු ලැබූ පශ්චාත් උපාධියට අමතරව බඳවා ගැනීම් පටිපාටියේ හා සේවා ව්‍යවස්ථාවේ සඳහන් වන පරිදි පශ්චාත් උපාධි සුදුසුකමක් හෝ ඊට ඉහළ සුදුසුකමක් සම්පූර්ණ කල යුතුය.

III. I ශ්‍රේණියට සහ විශේෂ ශ්‍රේණියට උසස්වීම සඳහා විශේෂිතව දක්වා ඇති ක්ෂේත්‍රයකට අදාළව ලබාගෙන ඇති පශ්චාත් උපාධියක්, බඳවා ගනු ලබන අවස්ථාවේදී මූලික සුදුසුකමක් ලෙස සලකා බඳවා ගෙන ඇත්නම් සහ එවැනි අවස්ථාවකදී කටයුතු කල යුතු ආකාරය පිළිබඳව බඳවා ගැනීමේ පටිපාටියේ හෝ සේවා ව්‍යවස්ථාවේ විශේෂිතව සඳහන් කර නොමැතිනම් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු නිලධාරීයාට I ශ්‍රේණියට සහ / හෝ විශේෂ ශ්‍රේණියට උසස්වීම සඳහා වෙනත් ක්ෂේත්‍රයකට අදාළ පශ්චාත් උපාධියක් සම්පූර්ණ කල හැක්කේය.

IV. මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනට පෙර බඳවා ගෙන ඇති අනු අංක III යටතේ සඳහන් විධිවිධාන අදාළ කරගත හැකි නිලධාරියකුට එම නිලධාරියා වෙනත් පශ්චාත් උපාධි සුදුසුකමක් සම්පූර්ණ කර ඇත්නම් හෝ ඒ සඳහා ලියාපදිංචි වී හෝ ඇත්නම්, අනු අංක III හි සඳහන් පරිදි ඉල්ලීමක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කල හැක්කේය.

V. ඉහත අනු අංක III හා IV පරිදි නිලධාරියකු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් එම පශ්චාත් උපාධිය අදාළ කර ගැනීම සම්බන්ධව වන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ අමාත්‍යාංශ ලේකම්ගේ නිරීක්ෂණ හා නිර්දේශ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කල යුත්තේය.

VI. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධානයන් මේ දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.ඒ.බී.දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව